උඩපළාත ප්‍රාදේශීය සභාව - 2023

---------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

උඩපළාත ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට උඩපළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණන සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්‍ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ දී, ගොඩනැගිලි ඉදිකිරීම් සහ සංවර්ධනය කිරීම සඳහා දැරූ රු.6,012,873 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2024 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේ දී, නිවැරදි කරන බව | ගොඩනැගිලි ඉදිකිරීම් ප්‍රාග්ධනිත කළ යුතුය |
| (ආ) | සභාවට අයත් රු.146,990 ක ට්‍රැක්ටර් ට්‍රේලරයක් රු.44,000 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් මෝටර් රථ හා කරත්ත ගිණුම රු.102,990 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අඩුවෙන් ගිණුම්ගත කිරීම නිවැරදි කරන බව | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ඇ) | ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ජංගම වත්කම් යටතේ දැක්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු 02 කට අදාළව ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී රු.985,990 ක් එම ස්ථාවර තැන්පතුවලට එකතු කර ආයෝජන යටතේ දක්වා තිබුණි. | ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය උපචිත නොකිරීම නිවැරදි කරන බව | ලැබිය යුතු පොලී නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.21,375,767 ක් වුවත්, එය රු.21,141,042 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන්, වර්ෂයේ ආදායම රු.234,725 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ දී, නිවැරදි කරන බව | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |

1.7 **අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | | |
| | 127 වගන්තිය | සභාව විසින් භාවිතයට ගනු ලබන සුසාන භූමි 65 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට අදාළ කටයුතු සිදුකරමින් පවතින බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය |
| (ආ) | **1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව** | | | |
| | අංක 59 හා 60 | සමාලෝචිත වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | 2024 වර්ෂයේ බලපත්‍ර සමීක්ෂණය ක්‍රියාත්මක කරන බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය |

2. **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.36,277,350 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.27,371,185 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

**2.2.1** **ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,345,375 | 2,858,268 | 3,533,730 | 3,418,956 | 2,399,000 | 5,748,890 | 6,482,593 | 4,094,418 |
| (ii) | කුලී | 6,736,550 | 4,326,739 | 4,423,730 | 2,839,048 | 6,175,300 | 4,430,270 | 4,050,709 | 2,936,039 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,505,500 | 1,241,481 | 1,241,481 | -- | 6,142,590 | 3,435,980 | 3,549,880 | -- |
| (iv) | වෙනත් ආදායම් | 51,653,340 | 56,176,787 | 79,988,981 | 44,361,338 | 41,340,000 | 35,216,269 | 55,522,773 | 68,173,532 |
| | එකතුව | 62,240,765 | 64,603,275 | 89,187,922 | 50,619,342 | 56,056,890 | 48,831,409 | 69,605,955 | 75,203,989 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ඒකකයක හිඟය රු.5,000 ක් ඉක්ම වූ දේපළ 43 කින් රු.419,545 ක ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, මේ සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් අය කර ගැනීම සඳහා ජංගම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇති අතර, හිඟ දැනුම් දීමේ ලිපි යොමු කර ඇති බව | හිඟ වරිපනම් අය කළ යුතුය |
| (ii) | 2013 වර්ෂයේ සිට ප්‍රාදේශිය සභාවට අයත් අක්‍රිය ජල යෝජනා ක්‍රම 09 ක ජල පාරිභෝගිකයින් 70 කගෙන් රු.803,614 ක හිඟ ජල ගාස්තු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පොතෙන් කපා හැරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව | හිඟ ආදායම් අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ආ) | **කුලී** | | |
| (i) | සභාවට අයත් පුස්සැල්ලාව පිහිටි කඩ කාමරවලින් 2012 වර්ෂයේ සිට පැවත එන රු.397,707 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පොතෙන් කපා හැරීමේ කටයුතු සිදුකිරීමට අවශ්‍ය තොරතුරු සකස් කරමින් පවතින බව | කඩ කුලී අය කළ යුතුය |
| (ii) | සභාවට අයත් පුස්සැල්ලාව පිහිටි තාවකාලික කඩ කාමර 10 කින් 2014 වර්ෂයේ සිට රු.2,030,454 ක හිඟ බදු මුදලක් අය කර නොතිබුණි. | හිඟ මුදල් ගෙවීමට කටයුතු කරන ලෙස දන්වා ලිඛිතව දැනුවත් කිරීම් යොමු කර ඇති බව | කඩ කුලී කාලීනව අය කළ යුතුය |
| (iii) | දොළුව සති පොළ බිම් මහලේ පිහිටි කඩ කාමර 02 කින් ද, දොළුව වෙළඳ පොළ ඉහළ මහළ හා සති පොලේ වාර්ෂික ටෙන්ඩර් ලබා දුන් කඩකාමර 10 කින් ද, වර්ෂ 05 ත් වර්ෂ 01 ත් අතර කාල පරාසයක සිට රු.65,065 ක හිඟ මුදලක් පැවතුණි. | හිඟ මුදල් අය කර ගැනීම සඳහා ලිපි යොමු කර ඇති බව | හිඟ කුලී අය කර ගැනීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඇ) | **දැන්වීම් පුවරු ගාස්තු** | | |
| | ආයතන 09 ක දැන්වීම් පුවරු 68 කින් රු.2,327,720 ක් වසර 02 කට වැඩි කාලයක සිට අය කර නොතිබුණි. | හිඟයෙන් රු.606,913 ක් අය කර ඇති බව | හිඟ ආදායම් අය කර ගත යුතුය |
| (ඇ) | **ත්‍රී රෝද රථ බලපත්‍ර ගාස්තු** | | |
| | 2020 ඔක්තෝබර් 09 වන දින අංක 2196/50 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති කුලී රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ නවතා තැබීම වෙනුවෙන්, අය කළ යුතු රු.1,291,000 ක මුදලක් අය කර නොතිබුණි. | හිඟයෙන් රු.97,200 ක් අය කර ඇති බව | ත්‍රී රෝද රථ නැවතුම් ස්ථාන විධිමත් කර ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය |

3. **මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා පනතේ 79 සිට 84 දක්වා වගන්ති අනුව, සභා බල ප්‍රදේශය තුළ පොදු කාණු ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම හා සම්බන්ධ කටයුතු සභාව විසින් ඉටු කළ යුතු වුව ද, සමාලෝචිත වර්ෂය තුළ දී සභාව විසින් ජලාපවාහන සම්බන්ධ කිසිදු සංවර්ධන කටයුත්තක් ඉටු කර නොතිබුණි. | මාර්ග ඉදිකිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දීම හේතුවෙන්, මෙම තත්ත්වය උද්ගතව ඇති බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 සිට 95 දක්වා වගන්තිවලට අනුව, මළ ප්‍රවාහනය සහ කසළ ශෝධනය ප්‍රාදේශීය සභාව විසින් ඉටු කළ යුතු වුවත්, ගලි රථයක් සපයා ගැනීමට හා මළ පිරිපහදු ඒකකයක් ආරම්භ කිරීමට සභාවේ අවධානය යොමු වී නොතිබුණි. | ගලි බවුසරයක් ගැනීමට යෝජනාවක් කමිටුවට ඉදිරිපත්ව ඇති බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය |
| (ඇ) | 1987 අගෝස්තු 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 119 වගන්තිය ප්‍රකාරව සභාව විසින් සති පොළක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී සතිපොළක් ආරම්භ කිරීමට කටයුතු යොදන බව | පනතින් දක්වා ඇති කාර්යයන් ඉටු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සමාලෝචිත වර්ෂයේ දී, දිරන කසළ මෙට්‍රික් ටොන් 257 ක ප්‍රමාණයක් එක් රැස් කර තිබුණ ද, සභාව විසින් කාබනික පොහාර නිපදවීමට හෝ වෙනත් විධිමත් කසළ කළමනාකරණ ක්‍රමවේදයකට යොමු නොවී දිරන කසළ කුණ්ඩසාලේ අළුත්වත්ත පිහිටි කාබනික පොහොර නිපදවීමේ මධ්‍යස්ථානය වෙත ලබා දීම වෙනුවෙන් කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවට රු.307,872 ක මුදලක් ගෙවා තිබුණි. | කසල බැහැර කිරීම අවම කිරීමටත් කටයුතු කර ඇති බව | විධිමත් කසළ කළමනාකරණ ක්‍රමයක් අනුගමනය කළ යුතුය |

3.2 **අනාර්ථික ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් සංවිධානය කරන ලද පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවට සහභාගී වීම සඳහා 2019 වර්ෂයේ දී, සභිකයින් දෙදෙනෙකු වෙනුවෙන් රු.120,000 ක් ගෙවා තිබුණ ද, එම සභිකයින් දෙදෙනා විසින් පාඨමාලාව සම්පූර්ණ කර නොතිබුණි. මේ සඳහා සභාවෙන් ගෙවන ලද මුදලින් රු.75,000 ක මුදලක් අය කර ගෙන නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව | අදාළ මුදල් අය කර ගත යුතුය |
| (ආ) | පුස්සැල්ලාව පිහිටි ලේකම් නිල නිවාසයේ සමාලෝචිත වර්ෂයේ දී, කිසිවෙකු පදිංචිව නොසිටිය ද, 2023 මාර්තු මස සිට ඔක්තෝබර් මස දක්වා රු.37,999 ක ජල බිල්පත් පියවා තිබීමෙන් අදාළ නිවාසය අයථා පරිහරණයට යොදවා ගෙන තිබුණි. | අදාල නිවස කුළියට ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇති බව | වත්කම්වල ආරක්ෂාව තහවුරු කළ යුතුය |

3.3 **කළමනාකරණ අකායර්ක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2013 වර්ෂයේ දී, රුපියල් මිලියන 45 ක වියදමින් ඉදිකර තිබුණු පුස්සැල්ලාව නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 14 කට පැරණි කඩහිමියන් 14 දෙනෙකු නඩු පැවරීම හේතුවෙන්, එම කඩ කාමර නිෂ්කාර්යයව පැවතුණි. පැරණි කඩ හිමියන් සභාව සමඟ විධිමත්ව ගිවිසුම්ගත වූ බවට කිසිදු තොරතුරක් සභාවේ නොතිබුණු අතර, මේ වන විට කඩහිමියන් 06 දෙනෙකු නඩුවෙන් ඉල්ලා අස් වී සභාව සමඟ ගිවිසුම්ගත වීමට කටයුතු කරන බව නිරීක්ෂණය විය. මේ අනුව, බදුකරුවන් නොවන පාර්ශවයක් අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇති බවත්, මේ වෙනුවෙන් නඩු ගාස්තු ලෙස රු.236,000 ක මුදල් වැය කිරීමට සිදු වී තිබුණි. | ගරු අධිකරණයට කරුණු වාර්තා කර නඩු ගාස්තු අය කර ගැනීමට කටයුතු කරන බව | අලාභ අය කර ගැනීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුස්සැල්ලාව පොදු වෙළඳ සංකීර්ණයේ සී - 04 දරන කඩ කාමරය 2013 වර්ෂයේ දී, රු.2,000,000 ක මුදලකට දීර්ඝ කාලීන බදු දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් ටෙන්ඩර් මුදලින් රු.860,000 ක් අය කර ගෙන නොතිබුණි. | හිඟ මුදල ගෙවන ලෙස ලිඛිතව දැනුම් දී ඇති බව | හිඟ මුදල් අය කර ගත යුතුය |
| (ඇ) | දොළුව සති පොළ බිම් මහලේ පිහිටි කඩ කාමර 13 ක් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට තක්සේරු කිරීමකින් තොරව මාසිකව රු.500 ක මුදලකට ටෙන්ඩර් කිරීමකින් තොරව බදු ලබා දී තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිඛිත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව | කඩ කාමර තක්සේරු කර බදු අය කළ යුතුය |
| (ඈ) | පුස්සැල්ලාව කළුගලවත්ත සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේ දී, තරුණ අභිවෘද්ධි සහ සමාජ, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත කොන්ත්‍රාත්කාර සමිතිය විසින් රු.956,809 ක වැඩ වටිනාකමකට ඉදිකිරීම් අවසන් කර තිබුණි. එම කොන්ත්‍රාත්කාර සමිතියට අදාළ කොන්ත්‍රාත් වටිනාකම නොගෙවීම හේතුවෙන්, කොන්ත්‍රාත්කාර සමිතිය විසින් නඩු පවරා තිබුණු අතර, 2023 මාර්තු 24 දිනැති නඩු තීන්දුව අනුව, කොන්ත්‍රාත්කරුට රු.2,519,240 ක වන්දි මුදලක් ගෙවීමට සභාවට නියෝග කර ඉන් රු.1,007,696 ක් ගෙවා තිබුණි. සභාවට සිදු වූ අලාභය සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර නොතිබුණි. | අදාළ පරීක්ෂණ කටයුතු මත ඉදිරි කටයුතු සිදු කරන බව | වගකිවයුතු නිලධාරින්ගෙන් අලාභ අය කර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවැති වසර 05 ක් ඉක්මවා තිබුණු රු.956,809 ක කර්මාන්ත ණයගැති ශේෂයක් අය කර නොතිබුණි. | මු.රෙ. 104(3) පරීක්ෂණය ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව | ලැබිය යුතු ශේෂ අය කර ගත යුතුය |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවැති කර්මාන්ත ණයහිමි ශේෂය රු.7,611,809 ක් වූ අතර, ඉන් වසර 05 ක් ඉක්මවා තිබුණු රු.956,809 ක් අය කර ගෙන නොතිබුණි. | මු.රෙ. 104(3) පරීක්ෂණය ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය |

3.4 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| 2022 හා 2023 වර්ෂවල දී, අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණු ගොඩනැගිලි සංවර්ධන අයදුම්පත් අතුරින් අයදුම්පත් 18 ක් සඳහා අනුමැතිය ලැබී නොතිබුණි. එසේ අනුමැතිය ලබා නොගත් අයදුම්පත් සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණි. | ඉදිරිපත් කරන ලද අයදුම්පත් අතරින් අයදුම්පත් 10 ක් සඳහා අනුමැතිය ලබා දීමට කටයුතු කර ඇති බව | අනුමැතිය ලබා නොගත් ඉදිකිරීම් සම්බන්ධයෙන් පසු විපරම් කළ යුතුය |

### 3.5 නිෂ්කාර්‍ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් රු.4,450,000 ක නිල නිවාස 02 ක් හා වටිනාකම හඳුනාගත නොහැකි නිල නිවාස 02 ක්, වසර 02 ත් වසර 19 ත් අතර කාලයක සිට නිෂ්කාර්යයව පැවතුණි. | නිෂ්කාර්යයව පවතින බව | නිල නිවාස භාවිතයට ගත යුතුය |
| (ආ) | 2021 වර්ෂයේ දී අවශ්‍යතාවය පිළිබඳව සළකා බැලීමකින් තොරව මිල දී ගෙන තිබුණු රු.85,488 ක වීජී පහන් කට්ටල 156 ක් භාවිතයෙන් තොරව ගබඩාවේ රඳවා තිබුණි. | අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් සහ නව වීජී පහන් සවි කිරීම සඳහා යොදා ගෙන ඇති බව | අවශ්‍යතාවය අනුව, මිලදී ගැනීම් කළ යුතුය |

### 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වත්තහේන ජල ව්‍යාපෘතිය සඳහා ක්ලෝරිනේටරයක් මිල දී ගැනීමට 2023 ජුනි 09 වන දින ආයතන 05 කින් මිල ගණන් කැඳවා තිබුණු අතර, ඉන් එක් ආයතනයක් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. එම මිල ගණන් පිරිවිතර අනුකූල නොවන බැවින්, නැවත මිල ගණන් කැඳවිය යුතු වුවත්, එසේ සිදු නොකර විද්‍යුත් තැපැල මඟින් එක් ආයතනයකින් ලබා ගත් මිල ගණනක් පදනම් කර ගනිමින් රු.289,800 ක වටිනාකමින් යුතු ක්ලෝරිනේටරයක් මිලදී ගෙන තිබුණි. | හදිසි අවශ්‍යතාවය මත විල්ගමුව කලාපයට ප්‍රධාන ලේකම් කාර්යාලයේ පුරනැඟුම ව්‍යාපෘතියට ක්ලෝරිනේටරය මිලදී ගැනීමට මිල කැඳවීම් සම්බන්ධ ප්‍රසම්පාදන තීරණයම ක්‍රියාත්මක කර අවම මිලට මිලදීගෙන තිබූ ක්ලෝරිනේටර යන්ත්‍රයම මිල දී ගත් බව | විනිවිදභාවයකින් යුතුව ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුය |

### 3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ගිවිසුම්ගත වූ සංවර්ධන යෝජනා සඳහා සමාලෝචිත වර්ෂයේ (2023 මුල් මාස 06) මාර්ග සම්මත මිල රේටයන් (HSR) භාවිතා කළ යුතු වුවත්, විධිමත් අධීක්ෂණයකින් හා වෘත්තීය වගකීමෙන් කටයුතු කිරීමකින් තොරව මාර්ග, කාණු හා බෝක්කු ඉදිකිරීම් ව්‍යාපෘති 29 ක් සඳහා 2022 වර්ෂයේ අවසන් කාර්තුවේ මාර්ග සම්මත මිල රේටයන් (HSR) මත ඇස්තමේන්තු සකස් කර ගෙවීම් කිරීම හේතුවෙන්, ප්‍රාදේශීය සභා අරමුදලට රු.621,240 ක පාඩුවක් සිදු වී තිබුණි. | 2023 මාර්තු මාසය තෙක් 2023 ට අදාළ මිල විග්‍රහයන් තාක්ෂණික නිලධාරීන්ට ලැබී නොමැති බව | ව්‍යාපෘතිය ඉටු කරන කාලයේ මාර්ග සම්මත මිල රේටයන් (HSR) භාවිතා නොකිරීම සම්බන්ධව කටයුතු කළ නිලධාරීන් හඳුනා ගෙන ක්‍රියාමාර්ග ගත යුතුය |

| | | | |
|---|---|---|---|
| (ආ) | යටිපියන්ගල නයාපාන මාර්ගය සංවර්ධනය කිරීම - රු.2,169,601 | | |
| | මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ඉදිරිපත් කර තිබුණු බිල්පත් අනුව, අංක 01 යටතේ අදියර 04 සඳහාම මාර්ග තලය ගල් කුඩු පුරවා තලා මට්ටම් කිරීම සඳහා ඝන මීටර් 216.04 ක් සඳහා රු.151,263 ක් ගෙවා තිබුණ ද, ස්ථාන 05 කින් මාර්ගය කඩා පරීක්ෂා කිරීමේ දී ගල් කුඩු හෝ ABC දමා නොතිබුණු බැවින්, ඉටු නොකළ කාර්යයන් සඳහා රු.151,263 ක් ගෙවා තිබුණි. එසේම, ඇස්තමේන්තුවේ වැඩ විෂයය අංක 02, 03, 04 යටතේ අදියර 01, 02, 03 හා 04 සඳහා මී.මී.50 හා මී.මී.19 ගල් ඝනකම මීටර් 0.075 ක ප්‍රමාණයකට අතුරා තැලීමට ඇස්තමේන්තු කර ඝන මිටර් 71.28 කට රු.724,363ක මුදලක් ගෙවා තිබුණි. මෙම මාර්ගයේ ස්ථාන 05 කින් සිදු කළ භෞතික පරීක්ෂාවේ දී, මෙම මාර්ගයේ ස්ථරයේ ඝනකම මීටර් 0.050 ක් වූයෙන්, ඇස්තමේන්තු ප්‍රකාරව කාර්යය ඉටු කර නොතිබිය දී, රු.241,454 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අත රැඳි මුදලින් නොකළ වැඩ සඳහා ගෙවූ මුදල් සහා අරමුදලට ලබා ගැනීමටත්, ඉතිරි මුදල් නිදහස් කිරීමටත් කටයුතු කරන බව | ඉටු නොකළ වැඩ සඳහා ගෙවීම් නිර්දේශ කළ නිලධාරීන් හඳුනා ගෙන අය කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ඇ) | මහර ඕර්වෙල් කොටසේ ඩී.එම්. අතුළ මැදගෙදර මහතාගේ නිවස අසළ සිට ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම - රු.543,446 | | |
| | මෙම මාර්ගය භෞතික පරීක්ෂාවේ දී, මාර්ගය අවසාන කොටසේ දිග මීටර් 12.6, පළල මීටර් 3.01 ක් හා ඝනකම මීටර් 0.125 ක කොටස තුළ ගල් ගැලවී තිබුණු බැවින්, ඝන මිටර් 4.748 ක ප්‍රමාණයකට රු.158,427 ක මුදලක් දුර්වල කොන්ක්‍රීට් මිශ්‍රණයක් සඳහා ගෙවීම් කර තිබුණු බව නිරීක්ෂණය විය. | කර්මාන්තය අධීක්ෂණය කළ කාර්මික නිලධාරිනිය විශ්‍රාමික බැවින්, ඇය සමඟ කර්මාන්තය පරීක්ෂා කර වාර්තා කරන බව | ඉදිකිරීම් නියමිත ප්‍රමිතියට සිදු කිරීම පරීක්ෂා නොකළ නිලධාරීන් හඳුනා ගෙන ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ඈ) | **පුපුරැස්ස නගරයේ පොදු වැසිකිළියක් ඉදිකිරීම රු.2,000,000** | | |
| | ව්‍යාපෘතියට අදාළ ලිපිගොනුව පරීක්ෂාවේ දී, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 05 ව පරිච්ඡේදයේ 5.4.4 අනුව, පිළිගත හැකි අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් ඉදිරිපත් කිරීම මත කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 ක උපරිමයක් දක්වා අත්තිකාරම් ගෙවිය හැකි වුව ද, එම උපදෙස් අනුගමනය නොකර, 2023 නොවැම්බර් 06 දින කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 50 ක් හෙවත්, රු.1,000,000 ක මුදලක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. | ඉදිරියට සියයට 20 ට වඩා අත්තිකාරම් මුදල් ගෙවීමට කටයුතු නොකරන බව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය |

## 3.8 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| අනුමත කාර්යය මණ්ඩලය හා තථ්‍ය කාර්යය මණ්ඩලය සමඟ සැසඳීමේ දී තනතුරු 06 ක පුරප්පාඩු 22 ක් හා එක් තනතුරක අතිරික්තතා 10 ක් පැවතුණි. | ප්‍රාථමික ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා සේවකයින් බඳවා නොගැනීමට කටයුතු කර ඇති බව | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය |
| **(ආ) සේවක ණය** | | |
| වැඩ තහනමට ලක් වූ හා මිය ගිය සේවකයින් 05 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය විය යුතු එකතුව රු.319,424 ක ණය ශේෂයක් අය කර නොතිබුණි. | විශ්‍රාම වැටුපෙන් අය කර ගත හැකි පුද්ගලයින්ගෙන් විශ්‍රාම වැටුපෙන් ණය අය කර ගැනීමටත්, එක් අයෙකුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව | අය විය යුතු සේවක ණය අය කර ගත යුතුය |